සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2020 | 11 ශ්‍රේණිය
மூன்றாம் தவணைப் பரீட்சை 2020 | தரம் 11
**Third Term Test 2020** | **Grade 11**

භූගෝල විද්‍යාව I | පැය එකයි
புவியியல் I | ஒரு மணித்தியாலம்
**Geography I** | *One hour*

## I – කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි.
- එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 යි.

- **1 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

**01.** 1 : 50000 පරිමාණයට අනුව සකස් කළ ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා අන්තරය මීටර් ................................................ කි. (20, 100, 500)

**02.** ආසියා මහද්වීපික තටකය තුළ පිහිටි දූපතක් වන්නේ ................................................ දූපතයි. (පැපුවා නිව්ගිනියා, කැනරි, සුමාත්‍රා)

**03.** ශ්‍රී ලංකාවේ ජල විදුලි පරිභෝජනය වැඩිම අංශය ලෙස .................................. අංශය දැක්විය හැකිය. (කර්මාන්ත, ගෘහස්ත, ප්‍රවාහන)

**04.** රුසියාවේ යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථානයකි. ................................................... (බර්මිංහැම්, ඔසාකා, කුෂ්නෙට්ස්ක්)

**05.** ශ්‍රී ලංකාවේ වී වගා බිම්වලින් වැඩි ප්‍රමාණයක් ව්‍යාප්ත වී ඇත්තේ ....................................... දිස්ත්‍රික්කයේය. (කුරුණෑගල, අනුරාධපුර, අම්පාර)

**06.** පලු, වීර, එරමිණියා, කරඹ, සූරිය වැනි ශාක වර්ග ......................................... වනාන්තර වල දක්නට ලැබේ. (කඩොලාන, වියළි මිශ්‍ර සදාහරිත, කටු පඳුරු හා ළඳු කැලෑ)

**07.** ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ ............................................ ගෝලය තුලය. (පරිවර්තී, අපරිවර්තී, මෙසෝ)

**08.** පෘථිවි අභ්‍යන්තරයේ ඇති මැග්මා පෘථිවිය මතුපිටට හෝ මතුපිට ආසන්නයට පැමිණ ඝණ වීමෙන් නිර්මාණය වන පාෂාණ .......................................... පාෂාණ ලෙස හඳුන්වයි. (ආග්නේය, අවසාදිත, විපරිත)

**09.** ශ්‍රී ලංකාවේ කෙඹලින් නිධි පිහිටි ප්‍රදේශයකි. ................................. (මීගමුව, දෙදියවෙල, මීටියාගොඩ)

**10.** ශ්‍රී ලංකාවේ තේ වගා කරන දිස්ත්‍රික්ක අතුරෙන් මැදරට තේ වගා කරන දිස්ත්‍රික්කයක් ලෙස ........................... වැදගත් වේ. (බදුල්ල, රත්නපුරය, නුවරඑළිය)

- **11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

**11.** ඇමෙරිකාවේ ඊසානදිග වෙරළබඩ කලාපය ද්විතීක ජන සංකේන්ද්‍රණයකට උදාහරණයකි. **නි / වැ**

**12.** මෙට්‍රික් සිතියම් වල දිශා සටහනේ අර්ධ ඊ හිසකින් නිරූපණය වන්නේ ජාල උතුරයි. **නි / වැ**

**13.** වලාකුළු හා අවකාශය අතර විසර්ජනය සිදු වීමෙන් ඇති වන අකුණු වලා අකුණු ලෙස හඳුන්වයි. **නි / වැ**

**14.** හග්ගල යනු දැඩි ස්වාභාවික රක්ෂිතයකි. **නි / වැ**

**15.** මුලුන්කාවිල් යනු භූගත ජල ද්‍රෝණියකට උදාහරණයකි. **නි / වැ**

- **16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' සහ 'ආ' යනුවෙන් තීර දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැලපූ විට පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

**16.** ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදනය කරන රටවල් 'අ' තීරුවේ ඇත. එම රටවල් වල දක්නට ලැබෙන නිෂ්පාදන මධ්‍යස්ථාන 'ආ' තීරයේ දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| (අ) | | (ආ) | |
|---|---|---|---|
| **1.** | චීනය | **A.** | දකුණු කාර්මික කලාපය |
| **2.** | රුසියාව | **B.** | බීජිං |
| **3.** | ඉන්දියාව | **C.** | ඔසාකා |
| | | **D.** | මොස්කව් |

**(1)** BDA **(2)** ABD **(3)** DAB **(4)** BAD (.........)

**17.** ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් වගා කරන බෝග වර්ග 'අ' තීරුවේ ද, එම බෝග වර්ග වලට අදාළ පර්යේෂණ ආයතන 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| (අ) | | (ආ) | |
|---|---|---|---|
| **1.** | තේ | **A.** | ලුණුවිල |
| **2.** | රබර් | **B.** | තලවකැලේ |
| **3.** | සුළු අපනයන බෝග | **C.** | අගලවත්ත |
| | | **D.** | මාතලේ |

**(1)** CDB **(2)** BDC **(3)** BCD **(4)** ABD (.........)

**18.** ලෝකයේ දක්නට ලැබෙන මහද්වීප 'අ' තීරුවේ ද එම මහද්වීපයන්හි ලෝක ජන සංඛ්‍යාවේ විශාලත්වය 'ආ' තීරුවේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| (අ) | | (ආ) | |
|---|---|---|---|
| **1.** | ආසියාව | **A.** | 8% |
| **2.** | උතුරු ඇමෙරිකාව | **B.** | 16% |
| **3.** | අප්‍රිකාව | **C.** | 5% |
| | | **D.** | 60% |

**(1)** ABC **(2)** DBA **(3)** DAB **(4)** DAC (.........)

**19.** ශ්‍රී ලංකාවේ විදුලි බලාගාර කිහිපයක් 'අ' තීරුවේ ඇත. එම විදුලි බලාගාර පිහිටුවීමට මුල් වූ ගංගා කිහිපයක් 'ආ' තීරයේ ද දැක්වේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදි ව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| (අ) | | (ආ) | |
|---|---|---|---|
| **1.** | සමනල වැව | **A.** | මහවැලි ගඟ |
| **2.** | කැනියන් | **B.** | මාදුරු ඔය |
| **3.** | රංටැඹේ | **C.** | කැළණි ගඟ |
| | | **D.** | වළවේ ගඟ |

**(1)** CBA **(2)** DAC **(3)** DCB **(4)** DCA (.........)

**20.** පෘථිවියේ දක්නට ලැබෙන ප්‍රධාන සාගර කිහිපයක් 'අ' තීරුවේ ද එම සාගර වල පිහිටා ඇති මුහුදු 'ආ' තීරුවේ ද දක්නට ලැබේ. 'අ' සහ 'ආ' තීරු නිවැරදි ව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| (අ) | | (ආ) | |
|---|---|---|---|
| **1.** | අත්ලාන්තික් සාගරය | **A.** | කහ මුහුද |
| **2.** | ඉන්දියන් සාගරය | **B.** | කැරිබියන් මුහුද |
| **3.** | පැසිපික් සාගරය | **C.** | අන්දමන් මුහුද |
| | | **D.** | සුදු මුහුද |

**(1)** BCA  **(2)** BCD  **(3)** CDA  **(4)** DBC  (.........)

- **21 සිට 26 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

**21.** සාර්ක් රටවල් අතර ඉහළම මානුෂ සංවර්ධනයක් ඇති රට .............................................. යි.

**22.** හෙක්ලා ගිනි කන්ද පිහිටා ඇති රට .......................................... යි.

**23.** මරියානා හා මින්ඩනාඕ යන ආගාධ පිහිටා ඇත්තේ .................................................... සාගරයේ ය.


**24.** නිශ්චිත භූමි ඒකකයක් තුළ ජීවත් වන ජන සංඛ්‍යාව .......................................... නමින් හඳුන්වයි.

**25.** ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව සංචාරක කලාප ................................ කට බෙදා ඇත.

**26.** ශ්‍රී ලංකාවේ අපනයන ගම්මාන අතරින් කජු වගාව සඳහා ........................................ ප්‍රදේශය වැදගත් වේ.

- **27 සිට 29 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ප්‍රස්තාරය යොදා ගන්න.**

**ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය මහ සහ යල 2010 – 2015 මෙට්‍රික් ටොන් බිලියන**




**27.** මහ කන්නයේ වැඩිම වී නිෂ්පාදනයක් ලැබී ඇත්තේ ........................................... වර්ෂයේ දීය.

**28.** යල කන්නයේ සමාන වී අස්වැන්නක් ලැබී ඇති වර්ෂ දෙක වන්නේ .............................................

**29.** සාපේක්ෂ වශයෙන් යල සහ මහ කන්න දෙකේදීම වැඩිම වී නිෂ්පාදනයක් වාර්තා වී ඇත්තේ ............................ වර්ෂයේදීය.

- **30 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**30.** ශ්‍රී ලංකාවේ බලශක්ති ප්‍රභව භාවිතය අනුව 43%, 4%, 37% ලෙස භාවිතයට ගන්නා බලශක්ති ප්‍රභව පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ කුමක් ද?

**(1)** ජල විභව, ගල් අඟුරු, ජෛව ස්කන්ධ **(2)** ජෛව ස්කන්ධ, ගල් අඟුරු, පෙට්‍රෝලියම්
**(3)** ගල් අඟුරු, ජෛව ස්කන්ධ, පෙට්‍රෝලියම් **(4)** පෙට්‍රෝලියම්, ගල් අඟුරු, පුනර්ජනනීය බලශක්තිය (.........)

**31.** සුළු අපනයන බෝගයක් වන මිරිස් වගාව බහුලව දක්නට ලැබෙන ප්‍රදේශය වන්නේ,

**(1)** කටුගම්පොල **(2)** දඹදෙණිය **(3)** කුරුණෑගල **(4)** රාජාංගනය (.........)

**32.** දමන, තමන්කඩුව ආදී ප්‍රදේශවල බහුලවම පවතින පස් වර්ගය වන්නේ,

**(1)** සොලිඩෙක්ස් හා සොලිනෙට්ස් පස **(2)** රතු දුඹුරු ලැටසෝල් පස
**(3)** රතු කහ පොඩ්සෝල් පස **(4)** දියළු පස (.........)

**33.** ශ්‍රී ලංකාවේ මයික්‍රෝ වාහන එකලස් කිරීමේ ප්‍රධාන කර්මාන්තශාලාව පිහිටි ප්‍රදේශය වන්නේ,

**(1)** කොළොන්න **(2)** බොරලැස්ගමුව **(3)** පොල්ගහවෙල **(4)** කැලණිය (.........)


**34.** පහත සඳහන් කවර පාෂාණ යුගලය අවසාදිත පාෂාණ වර්ගයට අයත් වන්නේ ද?

**(1)** හුණුගල් හා ගල් අඟුරු **(2)** ග්‍රැනයිට් හා බැසෝල්ට්
**(3)** කිරිගරුඬ හා ඩොලමයිට් **(4)** ගැබ්රෝ හා නයිස් (.........)

**35.** පහත සඳහන් ඒවා අතුරෙන් ශ්‍රී ලංකාවේ ආහාර පිසීම සඳහා භාවිත බලශක්ති ප්‍රභව අවරෝහණ පිළිවෙලට දැක්වෙන පිළිතුර කුමක් ද?

**(1)** L.P ගෑස්, ජල විදුලි බලය, දැව **(2)** දැව, ජල විදුලි බලය , L.P ගෑස්
**(3)** දැව, L.P ගෑස්, භූමිතෙල් **(4)** භූමිතෙල්, L.P ගෑස්, ජල විදුලි බලය (.........)

- **පහත රූප සටහන් උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 36 සිට 38 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




A B C

**36.** ඉහත A රූප සටහනේ x – y රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය වන්නේ,

**(1)** උත්තල බෑවුමකි **(2)** අවතල බෑවුමකි **(3)** දළ බෑවුමකි **(4)** මද බෑවුමකි (.........)

**37.** ඉහත B රූප සටහනේ P – Q රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය වන්නේ,

**(1)** නෙරුවකි **(2)** නිම්නයකි **(3)** ජල කපොල්ලකි **(4)** දිය බෙත්මකි (.........)

**38.** මෙහි C රූප සටහනෙන් දක්වා ඇති ජලවහන රටාව වන්නේ,

**(1)** ශාඛීය ජලවහන රටාව **(2)** අරීය ජලවහන රටාව
**(3)** වලයාකාර ජලවහන රටාව **(4)** ජාලාකාර ජලවහන රටාව (.........)

**39.** ගැඹුරු සාගරයේ යමහල් ක්‍රියාකාරිත්වය මගින් ඇති වූ දූපතක් වන්නේ,

**(1)** පැපුවා නිව්ගිනියා **(2)** සුමාත්‍රා **(3)** මැඩගස්කරය **(4)** අයිස්ලන්තය (.........)

**40.** කිලෝමීටර් 14 ක් දිග A ශ්‍රේණියේ මාර්ගයක් 1 : 50000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන දුර,

**(1)** 28 cm කි **(2)** 14 cm කි **(3)** 21 cm කි **(4)** 7 cm කි (.........)